# දයාරත්න අමරා දිගු ගමනක මතක සටහන්.

ප්‍රවීණ ගීත රචක
**සුනිල් සරත් පෙරේරා**



ආචාර්ය දයාරත්න රණතුංග සහ මහාචාර්ය අමරා රණතුංග සිංහල ගීතයේ හා සංගීතයේ නවමු පුබුදුවක් ඇති කිරීමට ඉමහත් මෙහෙවරක් කල සංගීත වේදීන් දෙපලකි. 1950 දශකය ආනන්ද සමරකෝන් සහ සුනිල් ශාන්ත ගීතය මුල් කරගෙන අළුත් සංගීතමය අත්හදා බැලීමට යෙළමුණු කාලයයි. ආනන්ද සමරකෝන්ගේ ''ඇසේ මධුර ජීවනයේ ගීතා'' සහ සුනිල් ශාන්තගේ ''ඕලු පිපීලා' යන ගීත මෙකී අත්හදා බැලීම් වල ස්වභාවය පැහැදිලි කරණ ගීත දෙකකි. දයාරත්න රණතුංගයෝද මේ මගෙහි යමින් ස්වකීය නිර්මාණාත්මක පළමු පරිශ්‍රමය කෙරෙහි යොමු වන්නේ මෙම කාලයෙදීමය. කලාත්මක ස්වගීතය පිළිබඳ ඔහු කල පර්යේෂණාත්මක අත්හදා බැලීම බූයේ ''මහ රෑ යාමේ'' ගීතයයි. මෙහි පද රචකයෝ මර්වින් සේනාරත්න සූරීන් වේ. යුග ගායනයේදී පළමුව දයාරත්නගේ වැඩිමහල් සොයුරිය සෝමලතා රණතුංග සහය වූ තර පසු කළකෙ අමරා රණතුංග සමග දයාරත්නයෝ මය ගායනා කළහ. මහ රෑ යාමේ නිර්මාණ්‍ය වුනේ 1955 වසරේදීය. මෙයට සවන්දුන් ආනන්ද සමරකෝන් සූරීහු දයාරත්නයන් දිරිමත් කර ඇත. (මේ ආරේ ගීත තමයි අපට ඕනෑ) යනුවෙන් පවසමිනි. මෙතැනින් ඇරඹුණු දයාරත්න රණතුංගයන්ගේ සරල හා ශාස්ත්‍රීය ගීනිර්මාණ කරණය ශ්‍රී ලාංකීය ජන විඥාණය කෙරෙහි ඇති කලේ ප්‍රභල බලපෑමකි. ගීත සාහිත්‍ය කේෂත්‍රයේ මා කළ පර්යේෂාත්මක අත්හදා බැලීම්වලටද දයාරත්න රණතුංග මහතාගේ නොමද සහය ලැබුණි. දයාරත්නයන්ගේ භාෂා සංවේදීතාවය හා පෘතුල සංගීථ ඥාණය මෙහිදී මගේ කටයුතු පහසු කළේය. දයාරත්න මහතා උත්තර භෘරතීය රාගධාරී සංගීතය මෙන්ම දේශීය ජනගීයේ නාදරූප මනාඥලෙස සංකල්පනය කිරීමේ රීතිය දැන සිටියේය. මහ රෑ යාමේ ගීතය මෙන්ම මවිසින් ලියන ලද දොන් තරිකිට දොන් තරිකිට ගීතයද මෙයට උදාහරණ වේ. දේශීය ජන ආරේ නාද ආකෘතියක් මත ලියවුන එම ගීතය නව නාද රූපයක ස්ථාරසාර කලේ දයාරත්නයන්ගේ ආණුභාවයෙනි.

''දොන් තරිකිට දොන්තරිකිට
දොන්තරිකිට තා
දොන් තරිකිට දොන්තරිකිට තා
කඳු වැටියෙන් බැස එනා
විටියාවත රඟ දෙනා
නෙතු නිදිගැට දුරලනා
හිරු එළියෙන් පිබිදුනා
රන් දේදුනු
රන් බරණින් සැරසිලා
දුල් නිලඹර සැරිසරා
හිරු එන................''

මාද මෙහිදී උත්සුක වයේ ජන වහර හා පැරණි සාහිත්‍ය භාෂාව (සෙව් වහර) සාංකලනය කරමින් නව රසයක් ජනිත කිරීමටය. දයාරත්නයන්ගේ මේ නාද තණුව ගායනා කලේ අමරා සමග අමරදේවයන්ය.

එදවස මා සේවය කලේ ගාලු මුවදොර මහ හෝටලයේය. මගේ කමරය් වාඩි වී සිටි අසුනට කෙල්න්ම දිස්වූයේ මහ සයුරයි, මහ සයුර දෙස් සැඳෑවේ බැස යන මල හිරුගේ නිසංසලව බැසයන ගත් ස්වභාවය නිසොල්මනේ මා වලාඋන් වාර බොහෝය. ඇතැම් විට මහා පාළුවක් හා තනිකමක් පරිසරයට මසිත්හි උපනි. මා මිත්‍ර දයාරත්නයෝද මගේ කන්තෝරුවට නිතර නිතර ආගිය සිරිතක් තිබුණි. මගේ කවුලු දොරින් ඈත සමුදුරේ පෙනුන මේ දසුන ඔවුන් මා මෙන්ම නිසලව බලාඋන් හැටි දැනුදු මතකයට නැගේ. අප වින්ද මෙම අත්දැකීම පසුකලෙක මධුර ගීතයක වින්දය වූලය බවට පත්විය.

''සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්' මෙම ස්ථානික විඥාණයෙන් මතුවූවක් ලෙස දැක්විය හැකිය. එය මෙදවස මසිත්හි පාළුව තනිකම දල්වන හුදකලාවේ ගීතයයි. සැන්දෑ අහසේ නාද තණුව නිර්මාණයේදී දයාරත්නයෝ සේවනය කර ඇත්තේ උත්තර භාරතීය රිගධාරී සංගීතයයි.

''සැන්දෑ අහසේ ඉරට මුවාවෙන් කාලය කවුලු දොරින් බැස යනවා
ඈත අතීතෙන් පියවර නගමින් කණාවැල අල්ලන් කවුදෝ එනවා''

මහචාර්ය අමරා රණතුංග ගායනා කරන ''මිහින්තලාවේ ගල් පඩි නගිනා'', ''සුරංගනා රුවින් සැදී'' හා ''වල ගැසී පිපි තාරකාමල්'' ගීතද මවිසින් ඇයට ලියා ඇත. එදවස දයා මෙන්ම අමරාද මා බරිඳ හා මා සමග ඇසුරු කල කාලයකි. ඒ පිළිබඳ ස්වෘතිය මෙහිදී මතුවේ.

''කාරණාව බුදු වෙනවා ලකුණු දැනේ
නෑර කැටුව ආවා මම සරණගෙනේ
භාවනාව තොර නොකරමි සිතින් අනේ
මාලිගාව අඳුරුයි අද සුවාමිනේ''

ඉහත කී කවිය ජනකවි සාහිත්‍යයේ එන්නකි. එදවස''මධුවන්ති'' ගුවන් විදුලි වැඩ සටහනකටද අමරාගේ හඬින් මධුරත්වයට පත් මේ කවිය මසිත් හි දැල්වූයේ අපූරු චමත්කාරයකි. පසු කලෙක සනත් නන්දසිරි සූරින් ගායනාකළ මවිසින් ලියන ලද ''යශෝධරා'' ගීතයට වින්දන මූලය බවට පත්වූයේ මේ අපූරු කවියයි. දයාරත්න රණතුංගයෝ ජනප්‍රිය ගීත රාශියක් ශ්‍රාවක ''රස හවි'' දැල්වීම සඳහා නිර්මාණය කර ඇති සූර සංගීතඥයෙකි.

දයාරත්න රණතුංග මහතා දිගු කලක් ගුවන් විදුලියට සම්බන්ධ වී ජාතියේ රසඥතාව උසස් තලයකට රැගෙන යාමට අප්‍රමාණ මෙහෙවරක් කලේය. පළමුව සංගීත අංශයේ නිෂ්පාදක පාලකයෙකු මෙන්ම ශ්‍රී ලංකා ගුවන් විදුලියේ සංගීත හා පර්යේෂණ අංශයේ පළමු අධ්‍යක්ෂක වරයා ලෙසද කටයුතු කිරීමේ භාග්‍ය ලැබුණි. එම අවධියේ නිශ්පාදනය කල (නාද රසාංග) වැඩසටහන රාගධාරී සංගීතයේ අප ලද ආභාෂය පෙන්නුම් කිරීමට යොදාගත් රසවත් වැඩසටහනකි.

''ගයමු ගයමු මිහිරි සින්දු''
''සවන රස රැන්දු රැන්දු'' ගීතමය වැඩසටහන ජනප්‍රිය ගීත සමූහ වශයෙන් ඉදිරිපත් කල වැඩසටහනකි. ඔහු නිශ්පාදනය කල ''මියුරස'' වින්දන වැඩසටහන නව නිර්මාණ රැසක් ගීත සාහිත්‍යයට එක්කරන්නට සමත් වූ නිර්මාණාත්මක වැඩ සටහනකි. 70 දශකයේ ලියූ ගීත රචකයන්ට හා නව නිර්මාණ කරුවන්ට මෙම ගින් දොර කවුලුවක් විවර විය. ආචාර්ය අජන්තා රණසිංහ හා මගේද ගීත රාශියක් ''මියුරස වින්දන'' වැඩසටහ තුලින් බිහි විය. අදයාර්ත්නයන් නිර්මාණය කල සරල මෙන්ම සරල ශාස්ත්‍රීය නාද තණු ශ්‍රාවකයන් අතර එදා මෙන්ම අදත් එකසේ ජනප්‍රියව පවතී. අජන්තා අමරාට ලියූ ''පාළු පැලේ මට තනි නෑ'', ''සපුමල් සුවඳක් සේ'' ඉන්ද්‍රාණි සේනාරත්න ගැයූ ''රතු පාට මල්'', ''කිරි කවඩි සිනා'' ආදී දයාරත්නගේ මනරම් තණුවලින් රසගැන්වුනි. මේ සියලු පරිශ්‍රමයයන් විමසිල්ලට ගැනීමේදී පෙනී යන්නේ දේශීය සංස්කෘතියක් ගොඩ නැගීමට දයාරත්න හා අමරා රණතුංගයන් ගත් කැප වීම හා උත්සාහයයි.

ශ්‍රී ලාංකීය සංගීත ඉතිහාසය පිළිබඳව විමර්ශනය කිරීමේදී මැනවින් පෙනී යයි. ඔවුන්ගේ සංගීත මෙහෙවර දෙයාකාරයකට විග්‍රහ කල හැකිය. ඉන් පළමුවැන්න නව නිර්මාණ සංගීත කාර්යයයි. දෙවැන් සංගීත අධ්‍යාපනයයි. නිර්මාණාත්මක සංගීත කරණයේ නිරතව ඔවුන් කල ගීත 50 දශකයේ සිට ජාතියේ රසහවු දැල්වීමට ආණුභාව පෑවේය. සංගීත අධ්‍යාපනයට ඔවුන් දෙපලගෙන් සිදුවූ සේවය සංගීත ක්ෂේත්‍රයේ මේ වන විට ජනප්‍රියත්වයට පත්ව ඇත. ඔවුන්ගෙන් ශිල්ප ශාස්ත්‍රය උගත් පිරිස දෙස බැලීමෙන් පෙනේ. සංගීත අධ්‍යාපනය ගැණ සැලකිලිමත් වීමේදී දයාරත්නයන් නිරත සංගීත පර්යේෂකතටවු ගවේශනය වැදගත් වේ. ඔහු මෑතක සිට විශ්ව ව්‍යාප්ත සංගීත ක්‍රම පිලිබඳව කල පරීක්ෂණයද සංගීථ චිකිත්සාව පිළිබඳ දැක්වූ උනන්දුවද මෙහිදී විශේෂයෙන් සඳහන්කල යුතුය. ආචාර්ය දයාරත්න රණතුංග හා මහාචාර්ය අමරා රණතුංග ගැයූ ජනප්‍රිය ගීත මෙල්බන් නගරයේදී ශ්‍රවණය කිරීමට ලැබෙන අවසථාව මෙල්බන් රසිකයන්ගේ සදා මතකයේ රැඳෙන මියැසි මිහිරක් වනු නොඅනුමානය. බටහිර වික්ටොරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය සාඩම්බරයේන ඉදිරිපත් කරන පාරමිතා බෞද්ධ විහාර අරමුදල සඳහා සංවිධානය කල ''උදුම්බරා'' ගී සරණිය බේසන් සෙන්ටර්හිදී ජූලි 02 සෙනසුරාදා සවස 6.00 ට පැවැත්වෙන අතර එය සාර්ථක වේවායයි මා ප්‍රාර්ථනා කරමි.

විමසීම් - මහින්ද 0425808642 ධනවංශ - 0469403981

